විශේෂඥ වෛද්‍ය සුදත් ධර්මරත්න
නියෝජ්‍ය අධ්‍යක්ෂක ජෙනරාල් වෛද්‍ය සේවා II
385 ,සුවසිරිපාය
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
සෞඛ්‍ය අමාත්‍යාංශය
2024-04-10

ගරු ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරු පාය
බත්තරමුල්ල

පාසල් ළමුන් සඳහා ක්‍රීඩා යෝග්‍යතා සහතික ලබා දීම

ක්‍රීඩා වෛද්‍ය විද්‍යා සංවර්ධන කමිටුව මගින් පාසල් ළමුන් සඳහා ක්‍රීඩායෝග්‍යතා වෛද්‍ය සහතික ලබා දීම සම්බන්ධව සම්පූර්ණ කාර්ය ඉටු කරනු ලබයි. වඩාත් ඵලදායි කාර්යක්ෂම සේවාවක් පාසල් ළමුන් වෙනුවෙන් ක්‍රීඩා වෛද්‍ය යෝග්‍යතා සහතික සම්බන්ධව ලබාදීම සඳහා අප කමිටුව ඔබතුමන් වෙත පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා ඉල්ලා සිටිමි.
අප කමිටුව විසින් දීප ව්‍යාප්තවරීඩා වෛද්‍ය යෝග්‍යතා සහතික පත් ලබාදීම සඳහා අනුමත සුදුසුකම් ලත් වෛද්‍යවරුන් දහසකට අධික සංඛ්‍යාවක් මේ වන විට පුහුණු කරවා ඇත. කලාප සහ කොට්ඨාස මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ට මෙකී වෛද්‍යවරුන් සමඟ සම්බන්ධ වී සහයෝගයෙන් මේ සඳහා කටයුතු කිරීමේ අවස්ථාව දැන් උදාවී ඇත. එකී වෛද්‍යවරුන්ගේ නාමලේඛනයක් සහ සම්බන්ධ කරගත හැකි දුරකථන අංක මේ සමග ඔබතුමන් වෙත එවමි. ඔබතුමන්ගේ අමාත්‍යාංශයේ උපාලි අමරතුංග මහතා සහ ක්‍රිෂාන් දුමින්ද යන මහත්වරුන් අපගේ කමිටුව නියෝජනය කරනු ලබයි. කමිටුවේ නිර්දේශ කිරීම්වලට අනුව මෙම ක්‍රීඩාවෛද්‍ය යෝග්‍යතා සහතික ලබා දීමේ ක්‍රමවේදය පිළිබඳ පාසල් මට්ටමින් ක්‍රීඩා භාර ආචාර්යවරු ,පුහුණුකරුවන්, විදුහල්පති, ගුරුභවතුන් සහ ළමුන් අතර පැහැදිලි අවබෝධයක් නොමැති බව පෙනේ. මෙම හේතුව මත රජයේ රෝහල්වල සමහර කාලවල ක්‍රීඩා වෛද්‍ය යෝග්‍යතා සහතික ලබා ගැනීමට පැමිණීමේදී අධික තදබදයක් ඇතිවීම නොවැළැක්විය හැකිව තිබේ. මෙවැනි තදබදයන් හේතුවෙන් විධිමත් ආකාරයට ක්‍රීඩකයන්ගේ වෛද්‍ය පරීක්ෂණ සිදුකිරීම අපගේ වෛද්‍යවරුන්ට අපහසු විය හැක. එමෙන්ම වෛද්‍ය පරීක්ෂණයට පසු නිසි කාලයක් ක්‍රීඩකයා පුහුණුවීමට ප්‍රථම යෙන් තරග පැවැත්වීමෙන් ක්‍රීඩකයන්ට ජීවිත අවදානම් ඇති විය හැක.
අප කමිටුව,අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2022-03-11 දින නිකුත් කොට ඇති ED/9/15/2/3 /පොදු දරන පාසැල් ක්‍රීඩා චක්‍රලේඛය පරිශීලනය කරනු ලැබේ. අපගේ වෛද්‍යවරුන් පුහුණු කිරීමේදී අදාල චක්‍රලේඛය පදනම් කොට ගෙන දැනුවත් කිරීම් සිදුකර ඇත. තවද එම චක්‍රලේඛය අපගේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ක්‍රීඩා යෝග්‍යතා වෛද්‍ය සහතික ලබාදීමේ වෛද්‍යවරුන් සඳහා වූ මාර්ගෝපදේශන ග්‍රන්ථයට ද ඇතුළත් කොට ඇත.
මීළඟ පාසැල් ක්‍රීඩා චක්‍රලේඛය නිකුත් කිරීමේදී ක්‍රීඩා වෛද්‍ය යෝග්‍යතා සහතික පත් ලබා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ ව දැනුවත් කිරීමේ කොටසක් ඊට ඇතුල් කරන ලෙස යෝජනා කරමි.
1.සෞඛ්‍ය අමාත්‍යාංශය නිකුත් කරන ක්‍රීඩා වෛද්‍ය සහතිකය සෞඛ්‍ය 1246 පත්‍රිකාව වේ. “1246 ක්‍රීඩා වෛද්‍ය යෝග්‍යතා සහතිකය” ලබා ගන්න.( ඇමුණුම)
2. වෛද්‍ය සහතික නිකුත් කරනු ලබන රෝහල හෝ වෛද්‍යවරයා කලින් අමතා /හමුවී පරීක්ෂණය සඳහා පැමිණෙන ළමුන් සංඛ්‍යාව සඳහන් කොට දිනයක් සහ වේලාවක් වෙන්කර ගන්න.එසේ පැමිණෙන අවස්ථාවේ දී වෛද්‍ය සහතික නිකුත් කිරීම සඳහා රෝහල් අධ්‍යක්ෂකතුමාගෙන් ඉල්ලුම් කරන ලද, විදුහල්පති තුමා හෝ ගුරුවරයෙකු විසින් අත්සන් කළ ළමයින්ගේ නම් ද ඇතුලත් වන ලිපියක් රැගෙන එන්න.

3. මෙම සහතිකය ලබාගැනීමට පැමිණීමේ දී පහත සඳහන් ලිපි ලේඛන රැගෙන රෝහල වෙත පැමිණීම අනිවාර්ය වේ

1.සෑම ක්‍රීඩකයෙකු විසින් නිවැරදිව පුරවන ලද අයදුම්පත්‍රය (ඇමුණුම)
2. ECG පරීක්ෂණය
3.පාස්පෝට් හෝ මුද්දර ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක්
4. වෛද්‍ය සහතික නිකුත් කිරීම සඳහා රෝහල් අධ්‍යක්ෂකතුමාගෙන් ඉල්ලුම් කරන ලද, විදුහල්පති තුමා හෝ ගුරුවරයෙකු විසින් අත්සන් කළ ළමයින්ගේ නම් ද ඇතුලත් වන කලින් අනුමත කරවා ගත් ලිපිය.

4. ක්‍රීඩා වෛද්‍ය යෝග්‍යතා සහතිකය කොටස් දෙකකින් යුක්ත වේ. පළමුව අප විසින් ලබා දෙන්නේ පූර්ව ක්‍රීඩා යෝග්‍යතා සහතිකය හෙවත් ක්‍රීඩකයාට <u>පුහුණුවීම් ආරම්භ කිරීම සඳහා සුදුසු යැයි පමණක් නිර්දේශ කරන වෛද්‍ය සහතිකයයි</u>.(PPE)

එම සහතිකය ලබා ගත් පසු <u>අවම සති දෙකක පුහුණුවෙන් පසු</u> ක්‍රීඩකයා නැවත පැමිණ <u>තරග සඳහා සහභාගි වීමට නිර්දේශ කරනු ලබන පූර්ව තරග ක්‍රීඩායෝග්‍යතා සහතිකය</u> ලබා ගත යුතුය.(PEE)

මේ අනුව තරගයකට ඉතා ආසන්නව පැමිණෙන ක්‍රීඩකයකුට තරග සඳහා වූ  සඳහා ක්‍රීඩා යෝග්‍යතා වෛද්‍ය සහතිකය(PEE)ඒ මොහොතේම ලබාගත නොහැක.

මෙම තත්ත්වයට පිළියමක් ලෙස ක්‍රීඩා වෛද්‍ය යෝග්‍යතා සහතිකය අවශ්‍ය වන්නා වූ ක්‍රීඩා කිහිපයේ දැනටමත් නියැලෙන හෝ අනාගතයේදී නියැලීමට අපේක්ෂා කරන ලමුන් ඊට ප්‍රථමයෙන් නිවාඩු කාලවලදී  රෝහල් වල ඇති ක්‍රීඩාවෛද්‍ය  ඒකක වෙත පැමිණ පූර්ව ක්‍රීඩායෝග්‍යතා සහතිකය(PPE)කල්තබා ලබා ගැනීමට යෝජනා කරමි.

එසේ නොවුණහොත් තරගයක් ආසන්නයේ පැමිණෙන ක්‍රීඩකයකුට අපගේ අමාත්‍යාංශයේ ක්‍රීඩා වෛද්‍ය මාර්ගෝපදේශන වලට අනුව සහ ක්‍රීඩා අනතුරු, අවදානම් අවම කිරීමේ අරමුණින් තරග වෛද්‍ය සහතිකය(PEE) ලබාදීමට නොහැකි වනු ඇත.

ශිෂ්‍ය හට, බාල දක්ෂ, කඳු නැගීම් වැනි ක්‍රීඩා වලදී මෙය වඩාත් ඵලදායි ලෙස ප්‍රායෝගිකව සිදුකළ හැක

මේ අනුව උක්ත කාරණා පිළිබඳව ඔබ  ආයතනයේ මීළඟට නිකුත්වන පාසැල් ක්‍රීඩා චක්‍රලේඛය මගින් සහ වෙනත් සුදුසු ආකාරයකට මූලිකවම පාසැල් ළමුන් , පුහුණුකරුවන්, ක්‍රීඩාබාර ආචාර්යවරුන්, විදුහල්පති සහ ගුරු බවතුන් සහ දෙමාපියන් දැනුවත් කිරීමට කටයුතු කරන්නේ නම් මහත් සේ කෘතඥ වෙමි.

තවද පාසැල් ක්‍රීඩා චක්‍රලේඛයේ යම් අලුත් වෙනස්කමක් සිදු වූ විට අපගේ කමිටුවටද එය දැනගැනීමට සලස්වන්නේ නම් ඉදිරි මාර්ගෝපදේශන පිළියෙළ කිරීමේදී අපට පිටිවහලක් වනු ඇත.

මේ සමඟ එවා ඇති ක්‍රීඩා වෛද්‍ය යෝග්‍යතා සහතික පත්‍රය ලබා ගැනීම සඳහා වන අයදුම් පත්‍රය සෑම පාසලකම විදුහල්පති හෝ ක්‍රීඩා ආචාර්ය සතුව මුද්‍රිත පිටපත් අවශ්‍ය ප්‍රමාණයට පවත්වාගෙන යන්නේ නම් ළමුන්ට එය මහත් පිටිවහලක් වනු ඇත.

ස්තුතියි

මෙයට විශ්වාසී

..................................................

විශේෂඥ වෛද්‍ය සුදත් ධර්මරත්න

නියෝජ්‍ය අධ්‍යක්ෂක ජෙනරාල්  වෛද්‍ය සේවා II